කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

# බාහිර විභාග අංශය

## වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය

### වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි දෙවන වසර පරීක්ෂණය (බාහිර) - 2010
### 2011 දෙසැම්බර් /2012 ජනවාරි

### BCOM E 2045 – උසස් මූල්‍ය ගිණුම්කරණය

ප්‍රශ්න සංඛ්‍යාව : 05 කාලය : පැය 03 යි

සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

01. 2000.04.01 දින සීමිත මිහිරි පොදු සමාගම සංස්ථාපිත කරන ලදී. 2011.03.31 දිනට මිහිරි සමාගමේ ශේෂ පිරික්සුම පහත පරිදි වේ.

| | හර (රු) | බැර (රු) |
|---|---|---|
| සාමාන්‍ය කොටස් (කොටස් 50,000) | | 750,000 |
| වරණීය කොටස් (කොටස් 10,000) | | 100,000 |
| පොදු සංචිතය | | 25,000 |
| ප්‍රත්‍යාගණන සංචිතය | | 60,000 |
| 2010.04.01 දිනට ලාභ හා අලාභ ගිණුම | | 169,000 |
| ගැණුම් | 1500,000 | |
| විකුණුම් | | 3850,000 |
| ණයගැතියෝ | 285,000 | |
| ණයහිමියෝ | | 300,000 |
| දේපළ, පිරියත හා උපකරණ 2010.04.01 දිනට පිරිවැයට | | |
| ඉඩම් | 1000,000 | |
| ගොඩනැගිලි | 500,000 | |
| ලී බඩු හා සවිකිරීම් | 250,000 | |
| මෝටර් වාහන | 375,000 | |
| 2010.04.01 දිනට ක්ෂය වෙන්කිරීම් | | |
| ගොඩනැගිලි | | 125,000 |
| ලීබඩු හා සවිකිරීම් | | 75,000 |
| මෝටර් වාහන | | 187,500 |
| ආරම්භක තොගය | 425,550 | |

| | | |
|---|---|---|
| ගෙවල් කුලී | 25,000 | |
| විදුලි බිල්පත් | 37,500 | |
| අඩමාන ණය සඳහා වෙන්කිරීම් | | 7,500 |
| අතුරු ලාභාංශ - සාමාන්‍ය කොටස් | 15,300 | |
| - වරණීය කොටස් | 18,000 | |
| නැවත සංස්ථාගත කිරීමේ වියදම් | 20,000 | |
| ආරම්භක වියදම් | 10,000 | |
| බැංකු ණය ( 10% - 2010.-09.01 ලබා ගත්) | | 500,000 |
| කාර්යාල වියදම් | 10,000 | |
| අත ඉතිරි මුදල් | 15,000 | |
| බැංකු ශේෂය | 18,000 | |
| විකුණුම් වියදම් | 18,150 | |
| විකුණුම් කොමිස් | 23,500 | |
| ආයෝජන | 1803,000 | |
| ආයෝජන ආදායම් | | 200,000 |
| | 6349,000 | 6349,000 |

ඔබට පහත අතිරේක තොරතුරු ලබා දී ඇත.

1. 2011.03.31 දින තොගය රු. 575,000 කට අගය කර ඇත.

2. උපචිත වියදම් : කුලී රු. 6000 සහ විදුලි බිල්පත් රු. 10,000

3. සෑම වර්ෂයකම වෙළඳ ණයගැති ශේෂය මත 5 % ක අඩමාන ණය වෙන්කිරීමක් කළ යුතු වේ.

4. රඳවා ගැනීම් බදු (WHT - 10 %) රහිත අගයට අතුරු ලාභාංශ පෙන්නුම් කරයි.

5. පහත ගනුදෙනු මෝටර් වාහන ගිණුමේ මෙම වර්ෂය තුළ සිදුවිය. පොත්වල රු. 20,000 (ගැණුම් පිරිවැය රු. 100,000) කට පෙන්වන පරණ ලොරියක් රු. 50,000 කට විකුණන ලද අතර එම අගය 2010.04.01 දින විකුණුම් ගිණුමට බැර කරන ලදී. 2010.07.01 දින අළුත් මෝටර් රථයක් රු. 150,000 කට ණයට ගන්නා ලදි.

6. සරල මාර්ග ක්‍රමයට පහත පරිද්ධ ක්ෂය වෙන්කිරීම් කළයුතු වේ.

   ගොඩනැගිලි 2 %

   ලීබඩු හා සවිකිරීම් 10 %

   මෝටර් වාහන 15 %

7. ප්‍රවර්තන වර්ෂය සඳහා බදු වගකීම රු. 120,000 කට ඇස්තමේන්තු කර ඇත.

8. 2012.04.01 දිනෙන් ආරම්භ කොට බැංකුණය වාර්ෂික වාරික 5 කින් ගෙවිය යුතු වේ.

9. අධ්‍යක්ෂකවරු පහත දෑ යෝජනා කරන ලදී.

i. පොදු සංචිතයට රු. 50,000 ක් මාරු කිරීමට

ii. සාමාන්‍ය කොටසකට රු. 1.50 ක ලාභාංශයක් යෝජනා කිරීම.

ඔබ විසින් පිළියෙල කිරීමට අවශ්‍ය වන්නේ,

i. කොටස්හිමියන්ට ඉදිරිපත් කිරීමට සුදුසුවන ආකාරයෙන් 2011.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය.

ii. වර්ෂය තුළ හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

iii. කොටස්හිමියන්ට ඉදිරිපත් කිරීමට සුදුසු වන ආකාරයෙන් 2011.03.31 දිනට ශේෂ පත්‍රය

iv. ගිණුම් සඳහා සටහන්

(මුළු ලකුණු 35)

02. 2011 මාර්තු මාසයෙන් අවසන් වන වර්ෂයේ සමනල සමාගමේ සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන හා සංසන්දනාත්මක ශේෂපත්‍ර පහත දක්වේ.

2011 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය

| | රු.000' |
|---|---|
| විකුණුම් | 10,820 |
| විකුණුම් පිරිවැය | (6,480) |
| දළ ලාභය | 4,340 |
| මෙහෙයුම් වියදම් | (1,020) |
| පොළි වියදම් | (215) |
| මෝටර් වාහන විකිණීමෙන් ලාභ | 25 |
| පොළී ආදායම් | 12 |
| ලාභාංශ ආදායම් | 280 |
| බදු පෙර ලාභ | 3,422 |
| ආදායම් බදු | (980) |
| බදු පසු ලාභය | 2,442 |

ශේෂ පත්‍ර

| | 2011 රු. 000' | | 2010 රු. 000' | |
|---|---|---|---|---|
| වත්කම් | | | | |
| දේපළ, පිරියත හා උපකරණ | | 2,805 | | 2,360 |
| ආයෝජන | | 2,820 | | 2,040 |
| තොග | | 1,970 | | 1,705 |
| වෙළඳ ණය ගැතියෝ | | 2,650 | | 1,840 |
| මුදල් හා බැංකු | | 48 | | 180 |
| | | 10,293 | | 8,125 |
| හිමිකම් | | | | |
| සාමාන්‍ය කොටස් ප්‍රකාශිත ප්‍රාග්ධන | | 5,000 | | 3,500 |
| රඳවාගත් ලාභ | | 2,512 | | 870 |
| | | 7,512 | | 4,370 |
| වගකීම් | | | | |
| දිගුකාලීන වගකීම් | 1,640 | | 2,170 | |
| වෙළඳ ණයහිමියෝ | 640 | | 720 | |
| ගෙවියයුතු පොලී | 21 | | 5 | |
| ගෙවියයුතු ආදායම් බදු | 456 | | 860 | |
| බැංකු අයිරාව | 24 | 2,781 | - | 3,755 |
| | | 10,293 | | 8,125 |

අතිරේක තොරතුරු

1. රු. 125,000 ක පිරිවැය හා රු. 75,000 ක පොත් අගය ඇති මෝටර් වාහනයක් වර්ෂය තුළ විකුණන ලදී.
2. ගෙවූ ලාභාංශ - රු. 800,000
3. දේපළ, පිරියත හා උපකරණ වලට අදාළ අතිරේක තොරතුරු පහත පරිදි වේ.

| | 31.03.2011 (රු. 000') | 31.03.2010 (රු. 000') |
|---|---|---|
| පිරිවැය | 4,275 | 3,600 |
| සමුච්චිත ක්ෂය | (1,470) | (1,240) |
| ශුද්ධ පොත් අගය | 2,805 | 2,360 |

ඔබ විසින් 2011.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කළ යුතු වේ.

(මුළු ලකුණු 30)

03. 2011.03.31 දිනට ඇල්ෆා සමාගමේ හා බීටා සමාගමේ ශේෂපත්‍ර පහත පරිදි වේ.

| | සීමාසහිත ඇල්ෆා සමාගම | සීමාසහිත බීටා සමාගම |
|---|---|---|
| | රු. | රු. |
| **වත්කම්** | | |
| **ජංගම නොවන වත්කම්** | | |
| දේපල පිරියත හා උපකරණ | | |
| යන්ත්‍ර | 135,000 | 67,500 |
| වාහන | 270,000 | 90,000 |
| ලීබඩු හා සවිකිරීම් | 105,000 | 120,000 |
| | 510,000 | 277,500 |
| කීර්තිනාමය | 75,000 | 45,000 |
| බීටා සමාගමෙහි ආයෝජන | 350,000 | - |
| ආයෝජන | 400,000 | 75,000 |
| තොගය | 60,000 | 60,000 |
| අතැති මුදල් | 15,000 | 18,750 |
| විවිධ ණයගැතියෝ | 30,000 | 22,500 |
| ලැබියයුතු බිල් | 11,250 | 15,000 |
| | **1451,250** | **513,750** |
| හිමිකම් හා වගකීම් | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | | |
| රු. 10 බැගින් සාමාන්‍ය කොටස් | 1200,000 | 150,000 |
| රු. 10 බැගින් සාමාන්‍ය කොටස් | 120,000 | - |
| පොදු සංචිතය | 86,250 | 25,500 |
| ලාභ හා අලාභ ගිණුම් | 30,000 | 15,750 |
| | 1,436,250 | 191,250 |
| දිගුකාලීන වගකීම් | | |
| ණය | - | 300,000 |
| කෙටිකාලීන වගකීම් | | |
| ණයහිමියෝ | 15,000 | 22,500 |
| | **1451,250** | **513,750** |

පහත අමතර තොරතුරු සපයා ඇත.

1. 2010.03.31 දින බීටා සමාගමෙහි සාමාන්‍ය කොටස් වලින් 80 % ක් ඇල්ෆා සමාගම අත්පත් කරගන්නා ලදී.

2. 2010.03.31 දිනට බීටා සමාගමෙහි රඳවාගත් ලාභ හර ශේෂය රු. 27,000 ක් විය.

3. 2010.03.31 දිනට බීටා සමාගමෙහි පොදු සංචිත ශේෂය රු. 5,500 ක් විය.

4. ඇල්ෆා සමාගමෙන් රු. 12,000 ක භාණ්ඩ තොගයක් බීටා සමාගම ණයට ලබා ගන්නා ලදී. 2011.03.31 දිනට එම මුළු තොගයම නොවිකිණී බීටා සමාගමෙහි ඉතිරිව පැවතිණි. විකුණුම් මිලට 20 % ක ලාභයක් ඇල්ෆා සමාගම තබා ගන්නා ලදී.

5. කීර්තිනාමය 10 % කින් හානිකරණය කරන ලදී.

2011.03.31 දිනට ඒකාබද්ධ ශේෂ පත්‍රය පිළියෙල කරන්න.

(මුළු ලකුණු 20)

04. A සමාගම රු. 60 බැගින් සාමාන්‍ය කොටස් 120,000 ක් නිකුත් කරන ලදී. ගෙවීම් පහත පරිදි සිදුකළයුතු වේ.

අයදුමේදී රු. 20
විභජනයේදී රු. 20
ඇරයුමේදී රු. 20

2010.08.01 - කොටස් 120,000 කට අයදුම්පත් ලද අතර සියල්ලටම කොටස් විභජනය කිරීමට තීරණය කරන ලදී.

2010.08.10 - විභජනය සිදුකරන ලදී.
2010.08.20 - කොටස්හිමියන් විභජන මුදල් සම්පූර්ණයෙන්ම ගෙවන ලදී.
2010.08.30 - ඇරයුම් මුදල් කැඳවන ලද අතර 2010.09.15 දින හෝ ඊට පෙර ගෙවිය යුතු වේ.
2010.09.15 - කොටස් 16,000 කට හැර ඉතිරිය සඳහා සම්පූර්ණ ඇරයුම් මුදල් ලැබිණි. සාංගමික ව්‍යවස්ථාවලිය අනුව හිඟ හිමි කොටස් සඳහා 8 % ක පොළියක් අය කිරීමට තීරණය කරන ලදී.
2010.09.30 - හිඟහිටි කොටස් නැවත විකිණීමක් සිදු කරන බව සමාගම හිඟහිටි කොටස් හිමියන්ට දැනුම් දෙන ලදී.
2010.10.15 - රු. 17,000 ක වියදම් දරමින් සමාගම එකක් රු. 60 බැගින් එම කොටස් නැවත විකුණන ලදී. අවසානයේ ඉතිරි මුදල් මුල් කොටස් හිමියන්ට ගෙවන ලදී.

අවශ්‍ය ලෙජර් ගිණුම් පිළියෙල කරන්න.

(මුළු ලකුණු 10)

05. පහත දෑ නිර්වචනය කරන්න.

අ. ප්‍රකාශිත ප්‍රාග්ධනය

ආ. ණයගෙවීමේ හැකියාව පිළිබඳ පරීක්ෂණ

(මුළු ලකුණු 05)